2016.07.08

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

**සිංහල භාෂාව හා සාහිත්‍යය** **6 ශ්‍රේණිය**

විභාග අංකය :.................................................... **කාලය පැය 02 යි**

### I කොටස

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

● පහත වාක්‍යයන්හි ඉරි ඇඳි පදවල අදහසට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න.

01. මිනිස් සංහතියේ <u>අතපල්ලෙන් වැටුණු</u> මේ වැදි පිරිසේ දර්ශනය ඉතා දිළිඳු එකක් විය.
    (1) අතෙන් පහළට වැටුණු (2) අත්තෙන් පහළට වැටුණු
    (3) කරදරයට පත් වුණු (4) අවධානයට ලක් නොවූ

02. <u>ඒකාන්තයෙන්</u> මේ අමනුෂ්‍ය පරිගෘහිත වූ පොකුණක් වුව මැනවි' යි දන පැන් නොබී සිටීම යහපත් ය.
    (1) එක පාරට ම (2) නිසැකයෙන් ම
    (3) සැකයෙන් ම (4) අනුමානයෙන් ම

03. සුමිත්‍රා <u>ලැල්ලට පාගා</u> ගිය බැවින් වේලාවට ම පාසලට යාමට හැකි විය.
    (1) ඉවසීමෙන් තොරව (2) අධික වේගයෙන්
    (3) ලැල්ල දමා යමින් (4) මඳ වේගයෙන්

● මුලින් දී ඇති පදවලට නොගැළපෙන පදය ඇතුළත් පද පේළිය තෝරන්න.
    (1) සඤ්ඤක - අඟල, වළල්ල, බැඳීම, සුවඳ
    (2) මහප්‍රාණ - ආරූඪ, සංඝයා, භූමිය, ධනය
    (3) යුගල පද - යනඑන, අඩුමකුඩුම, සැපදුක්, ලාභපාඩු
    (4) ක්‍රියා පද - නටනවා, දුවනවා, පනිනවා, කඩනවා

● පහත සඳහන් අක්ෂරවලින් හල් නොවන අක්ෂරය ඇතුළත් පදය තෝරන්න.
    (1) පූසා (2) සුවඳ (3) පාලම (4) ඇතා

● සියලු ම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි පද පේළිය තෝරන්න.

05. 1. (1) ලේඛණය, සමස්තය, ශීලය, භාෂාව (2) ප්‍රස්තාරය, ලේඛකයා, ලේඛම්, ප්‍රතිභාව
    (3) නිෂ්පාදනය, අවස්ථාව, වාර්තාව, ඒකරන්ධු (4) අධිෂ්ඨාන, අමනුශ්‍ය, ස්ථාවර, සංඛ්‍යා

    2. (1) ශ්‍රේෂ්ට, විශිෂ්ට, කුසලතාව, ඉෂ්ට (2) ප්‍රතිභාව, ප්‍රදර්ශනය, වාර්ෂික, පෞද්ගලික
    (3) විදේශ, ඖෂධ, පාඨකයා, වංශය (4) දක්ෂිණ, දණ්ඩනය, දිව්‍යාංගණාව, ශබ්දය

● පහත දී ඇති කොටසෙන් උක්ත පදයක් සහ අනුක්ත පදයක් තෝරන්න.

06. 1. මහලු ගැමියෝ, පොත් පත්වලින් හෝ ගුරුවරුන්ගෙන් හෝ බොහෝ කොට ඉගෙනීමෙන් ලත් ප්‍රතිභාව ඇති කවීන් නොවෙති.
    ★ උක්ත පදය ................................ ★ අනුක්ත පදය ................................

06. 2. මිනින්දෝරුවෝ ඉඩම් හිමියන් හමුවෙති.

⋆ උක්ත පදය .............................. ⋆ අනුක්ත පදය ..............................

• පහත දී ඇති වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

07. 1. මම ගීතයක් රස විඳිමි. ..............................

2. පාරිභෝගිකයා වෙළඳපොළට යයි. ..............................

• හිස්තැනට සුදුසු ආඛ්‍යාතය තෝරා ලියන්න.

08. 1. සංචාරකයෝ පෙරහැර ..............................

(1) නැරඹුවේය. (2) නැරඹූහ. (3) නැරඹුවාය. (4) නරඹයි.

2. ඇය සිය සිතුවම නිර්මාණය ..............................

(1) කළාය. (2) කළේය. (3) කළෝය. (4) කෙරූහ.

• හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.

09. 1. ගස් සැමට සෙවණ ලබා .............................. (දෙයි / දෙති)

2. තුරු පෙළ සුළඟට .............................. (සෙලවෙති / සෙලවෙයි)

• හිස්තැනට සුදුසු අක්ෂරය වරහන් තුළින් තෝරා ලියන්න.

10. 1. (1) වි ........... මය (ස් / ෂ්) (2) ආ..........චර්ය (ශ් / ෂ්)

2. (1) බස් නැවතුම් පො............. (ල / ළ) (2) මහ........... නිවාසය (ලු / ළු)

• ඉරි ඇඳි පදයට විරුද්ධ පදය යොදා වාක්‍ය නැවත ලියන්න.

11. 1. <u>ආරෝහණ</u> ක්‍රමයට සැදීමට තිබූ ගණන් සියල්ල ම සාදා නිම කිරීමට සුමුදුට <u>හැකි විය</u>.

..............................................................................................

2. පාලකයා <u>දේශප්‍රේමීන්ට</u> උපහාර පුද <u>කළේය</u>.

..............................................................................................

• 'වනය' යන්නට සමාන නොවන පදය තෝරන්න.

12. 1. (1) කැලය (2) වල (3) වනාන්තරය (4) වදුල

• 'උදෑසන' යන්නට සමාන නොවන පදය තෝරන්න.

1. (1) පාන්දර (2) උදය (3) අලුයම (4) මධ්‍යහ්නය

• පහත සඳහන් වාක්‍ය බහු වචනයට හරවා ලියන්න.

1. මම ගෙදර යමි. ..............................

2. මුවා වනයට පලා ගියේය. ..............................

• විරාම ලකුණු නිවැරදිව යොදා ඇති වාක්‍ය තෝරන්න.

14. 1. අනේ ! ඇයි මෙහෙම වුණේ.

2. "ඔහුගේ නම, ජිනදාස වුවද මා ඔහුට හඬගාන්නේ 'ජින්නා' යන නමිනි"

3. ඌට 'කොළයා' යි කියන්නේ එහෙයිනි.

4. "අනේ දෙයියනේ, තාත්තාගේ අවවාදය පිළිපැද්දා නම්, කොච්චර හොඳද ?

REFERENCE ONLY

- පහත සඳහන් පිරුළු සම්පූර්ණ කරන්න.

15. 1. පතිත රිළවුන්ට ..............................

2. .............................. කොළ කඩා පැවා වගේ.

- පහත සඳහන් වාක්‍යවල උපමාව හා උපමේය තෝරා ලියන්න.

16. 1. කට ඇරියා විතරයි නැට්ටෙන් ගැලවුණ තල් ගෙඩියක් වාගේ ඉබ්බා ජොග් ගාලා දෙණියට වැටුණා.

★ උපමාව ..............................

★ උපමේය ..............................

2. සිරිපාලගේ නෙත් දෙක ගිනිබෝලයක් මෙන් යැයි සුනිල් කීවේය.

★ උපමාව ..............................

★ උපමේය ..............................

- පහත සඳහන් වාක්‍යවල ඇතුළත් නාම විශේෂණ පද තෝරා ලියන්න.

17. 1. සුදු නැන්දා පොළට ගියාය. ..............................

2. මාලා සිඟිති දියණියගේ මුහුණ සෝදයි. ..............................

- පහත දී ඇති අදහසට ගැළපෙන තනි පද ලියන්න.

18. 1. (1) රට රටවල ඇවිදින්නා ..............................

(2) අශ්වයා ගාල් කරන ස්ථානය ..............................

2. (1) ජලයේ උපන් ..............................

(2) සියල්ල දන්නා ..............................

- පහත සඳහන් වාක්‍යවල ක්‍රියා විශේෂණ පද තෝරා ලියන්න.

19. 1. සුගත් මාමා වේගයෙන් දිව්වේ ය. ..............................

2. හයියෙන් හැඬූ මල්ලී තාත්තා ළඟට ගියේ ය. ..............................

- පහත සඳහන් වාක්‍යවල පුරුෂලිංග පද ස්ත්‍රී ලිංගයට හරවා ලියන්න.

20. 1. බාප්පා උදෑසන ම රැකියාව ට පිටත් ව ගියේ ය. ..............................

2. නළුවා රංගනයේ යෙදෙමින් ගායනා කළේය. ..............................

(ලකුණු 2 x 20=40)

## II කොටස

* පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5ක ට පිළිතුරු ලියන්න.

01. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150ක ට නොඅඩු රචනයක් ලියන්න.

(1) එකමුතුකමින් ලොව ජය ගනිමු.

(2) මා සිත් ගත් ලේඛකයා.

(3) ජල රකුසා ගම වනසයි.

(4) මම ගැල්කරුවෙක් වෙමි. (ලකුණු 20)

02. ඔබ පංති කාමරය තුළ ඉටු කරන ලද ඇගයීම ඇසුරෙන් පිළිතුරු ලියන්න.

(1) ඔබ විසින් ඉටු කරන ලද කේවල පැවරුමේ නම ලියන්න.

(2) මෙම පැවරුම ඉටු කිරීමේ දී තොරතුරු සපයා ගත් ක්‍රම 2ක් ලියන්න.

(3) පැවරුම ඉටු කිරීමෙන් ඔබට ලබා ගත හැකි වූ වාසි 2ක් ලියන්න.

(4) මෙම පැවරුම ඉටු කිරීමේ දී ඔබට මතු වූ ගැටලු 02ක් ලියන්න.

(5) ඔබ ඉටු කරන ලද කේවල පැවරුම සම්බන්ධ ඔබගේ අදහස කෙටියෙන් ලියන්න. (ලකුණු 10)

03. ඔබේ පාසලෙන් ස්ථාන මාරුවක් ලබාගෙන, දුර බැහැර පළාතකට ගිය ගුරුවරයාට පාසලේ චිත්‍ර ප්‍රදර්ශනයට පැමිණෙන ලෙස දන්වා ලිපියක් ලියන්න. හෝ

ශිෂ්‍යත්ව විභාගයෙන් උසස් ලෙස ජයග්‍රහණය ලැබූ මිතුරාට යැවීමට සුදුසු සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

(ලකුණු 10)

04. පහත සඳහන් කවියේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

සඳවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු
සිටුවා දොර දොර රඹතුරු
තබවා පුන් කුඹු විසිතුරු

හෝ

පහත සඳහන් ගද්‍ය පාඨයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

උදක රාක්ෂසයා ද ඒ වඳුරන් දියට නොබස්නාවුත් දක නිල් වූ බඩ හා ධවල වූ මුඛ ඇතිව, රත් වූ අතුල් තල, පතුල් තල ඇතිව භයංකාර වේශයෙන් .............

(ලකුණු 10)

05. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ගොඩ මඩ දෙකම සරු සාරය පල බරය
කටුරොද ගම්මානය තරමක් පිරිසරය
ඒ ගම මැදින් ගලනා ගඟ මනහරය
කඩමංඩිය පිහිටියේ ඒ ගම කෙළවරය

(ලකුණු 10)

1) මෙහි සඳහන් ගමෙහි නම කුමක් ද ?
2) මෙම ගම සශ්‍රීක බව කියැවෙන පද පේළිය උපුටා දක්වන්න.
3) මෙම කවියේ සඳහන් පරිදි ගමෙහි සුන්දරත්වයට බලපෑවේ කුමක් ද ?
4) ගමෙහි කෙළවර පිහිටා තිබුණේ කුමක් ද ?
5) පහත සඳහන් වචනවල විරුද්ධ පද ලියන්න.

⋆ පිරිසර - ⋆ මනහර -

(ලකුණු 10)

06. පහත සඳහන් ප්‍රශ්නවලට පෙළ පොත ඇසුරින් පිළිතුරු ලියන්න.

1) පන්සිය පනස් ජාතක පොත රචනා වූයේ කුමන රාජධානි සමයක ද ?
2) "නරි නයිදේ රවටිච්චී" ජනකතාව උපුටා ගත් කෘතිය කුමක් ද ?
3) කාව්‍යශේඛරය රචනා කරන ලද්දේ කවුරුන් ද ?
4) කැවුම් ගස්වලින් කඩා ගන්නා දෙයක්ද'යි ඇසුවෝ කවුරුන් ද ?
5) කොළයා කිත්තර දමන්නේ කෙසේ ද ?

(ලකුණු 10)